දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2014 පරීක්ෂණය - 2017 ඔක්තෝබර්
Bachelor of Arts General (External) Degree Part II 2014 Examination – October 2017

# ඉසා 3.1 - ශ්‍රී ලංකා ඉතිහාසය (ක්‍රි.ව. 1796 සිට ක්‍රි.ව. 1948 දක්වා)
# HYG 3.1 - History of Sri Lanka (From 1796 AD. to 1948 AD.)

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

01. උඩරට රාජධානියේ බිඳවැටීමට හේතු වූ අභ්‍යන්තර හා බාහිර වශයෙන් බලපාන ලද කරුණු විචාරාත්මකව විමසන්න.

02. "ඌව - වෙල්ලස්ස නිදහස් සටන වූ කලී පරාධීනත්වයෙන් ගැලවීමට දරණ ලද ප්‍රථම උත්සාහයයි." ඌව - වෙල්ලස්ස නිදහස් සටනට තුඩු දුන් හේතු හා ඉන් උද්ගත වූ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

03. කෝල්බෲක් කැමරන් කොමිසම විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම, පරිපාලන සහ අධිකරණ ප්‍රතිසංස්කරණ යෝජනා පරීක්ෂා කරන්න.

04. 19 වන සියවසේ මෙරට වැවිලි කර්මාන්තයෙන් උද්ගත වූ සමාජ, ආර්ථික ප්‍රතිඵල විමසුමට ලක් කරන්න.

05. 19 වන සියවස මැද භාගයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන පුනරුදය පිළිබඳව ඓතිහාසික රචනයක් ලියන්න.

06. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට වාරි කර්මාන්තය දියුණු කිරීමට අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග පහදන්න.

07. පහත දැක්වෙන මාතෘකා පාඨ අතුරින් <u>දෙකක්</u> පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.
    i. අමද්‍යප ව්‍යාපාරය
    ii. 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය
    iii. ලංකා සම සමාජ පක්ෂය
    iv. ලංකා ජාතික සංගමය
    v. පොපිමල් අරමුදල

08. ශ්‍රී ලංකාවට නිදහස හිමිවීමට ආසන්න කාලයේ බ්‍රිතාන්‍ය හා මෙරට අතර පැවති සම්බන්ධතාවල ස්වභාවය පැහැදිලි කරන්න.